# යෝගාචාර සම්ප්‍රදායගත අෂ්ට විඥාන සංකල්පයේ කෙලෙස් මනස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

තෙල්හවඩිගම පියරතන හිමි[1]

## හැඳින්වීම

යෝගාචාර සම්ප්‍රදාය යනු ඉන්දියාවේ මධ්‍යමක දර්ශනයට සමගාමීව විකාශනය වූ මහායාන බුදුදහමේ පවතින ප්‍රධාන දාර්ශනික ධාරාවන් දෙකෙන් එකකි. "යෝග" (භාවනාව ) සහ "ආචාර'' (ප්‍රතිපදාව) යන වචනවල එකතුවෙන් සැදුණු මෙම නාමයෙන් අදහස් වන්නේ භාවනාමය පිළිවෙත් මගින් සිත පරිවර්තනය කිරීම අවධාරණය කරන සම්ප්‍රදාය යන්නයි. ලෝකයේ පවතින එකම සහ පරම යථාර්ථය විඥානය පමණක් බව අවධාරණය කරන බැවින් මෙය "විඥානවාදය" ලෙසත්, සැබවින්ම පවතින්නේ සිත පමණක් බව පවසන නිසා "චිත්තමාත්‍ර"ලෙසත්, බාහිර ලෝකය යනු සිතේම ප්‍රක්ෂේපණයක් බව පවසන මූලධර්මය නිසා "විඥප්තිමාත්‍රතාව"ලෙසත් විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලබයි.

මෙම සම්ප්‍රදාය ක්‍රිස්තු වර්ෂ 4 වන සහ 5 වන සියවස්වල දී අසංග සහ වසුබන්ධු යන මහා ප්‍රාඥයන් විසින් දාර්ශනිකව හා මනෝවිද්‍යාත්මකව ස්ථාපිත කරන ලදි. විශේෂයෙන්ම වසුබන්ධු හිමියන් විසින් රචිත "විංශතිකා'' (විසි වැදෑරුම් ප්‍රඥප්තිය) සහ "ත්‍රිංශිකා'' (තිස් වැදෑරුම් ප්‍රඥප්තිය) යන කෘති ද්විත්වය මෙම දර්ශනයට අදාළ ඉතිහාසය, මූලධර්ම හා මනෝවිද්‍යාත්මක පදනම විග්‍රහ කිරීමට ඇති ප්‍රධාන අධිකාරී මූලාශ්‍රය ලෙස සැලකේ. බුදුන් වහන්සේගේ දේශනාවල "තෙවන ධර්ම චක්‍ර ප්‍රවර්තනය'' ලෙස තමන්ව හඳුන්වා ගන්නා යෝගාචාර සම්ප්‍රදාය, පළමු සහ දෙවන ධර්ම චක්‍රවල (අභිධර්ම හා මධ්‍යමක) පැවති ඇතැම් දාර්ශනික ගැටලු නිරාකරණය කරන පූර්ණ අර්ථකථනයක් ලෙස ස්වකීය ඉගැන්වීම් ඉදිරිපත් කරයි. යෝගාචාරවාදීන්ගේ මූලික ඉගැන්වීම වන්නේ බාහිර ලෝකය යනු සැබවින්ම සිතින් පරිබාහිරව ස්වාධීනව පවතින වස්තූන් සමූහයක් නොව, විඥානය තුළම හටගන්නා පෙනීම් පමණක් බවයි. මීට මූලික පදනම සපයන්නේ ලංකාවතාර සූත්‍රයේ එන "ත්‍රෛලෝකයම සිත පමණක් (චිත්තමාත්‍ර) වේ'' යන ප්‍රකට දේශනාවයි.

සාම්ප්‍රදායික අභිධර්ම මනෝවිද්‍යාවේ එන විඥාන හය (ඇස, කන, නාසය, දිව, කය සහ මනස සම්බන්ධ විඥාන) මගින් කර්මයේ අඛණ්ඩතාව, පුද්ගල අනන්‍යතාව සහ ගැඹුරු භාවනා අවස්ථාවල සිතේ පැවැත්ම පැහැදිලි කිරීමට අපොහොසත් වීම නිසා, යෝගාචාරීන් විසින් විඥානයේ තවත් සූක්ෂ්ම ස්ථර දෙකක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, හත්වන විඥානය වන "ක්ලේශ මනස" සහ අටවන විඥානය වන "ආලය විඥානය" එක් කරමින් "අෂ්ට විඥාන'' ආකෘතිය ඔවුහු ගොඩනැගුහ. ආලය විඥානය යනු සියලු අත්දැකීම් හා කර්ම බීජ ගබඩා වී පවතින සන්චිතයක් වන අතර, ක්ලේශ

1 පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.
thelhawadigamapiyarathanathero@gmail.com

මනස මගින් ආලය විඥානය දෙස බලමින් "මම'' යන ව්‍යාජ හැඟීම ජනිත කරයි. මෙම මනෝවිද්‍යාත්මක විග්‍රහය බුදුදහමේ එන "අනාත්ම'' දර්ශනය තුළ කර්මය සහ නැවත ඉපදීම සිදුවන ආකාරය තර්කානුකූලව තහවුරු කිරීමට ඉවහල් වේ. බාහිර ලෝකය පිළිබඳ පවතින මිථ්‍යා විශ්වාස අතහැර, විඥානයේ මෙම ගැඹුරු ස්ථර හා ඒවායේ පරිණාමය අවබෝධ කර ගැනීමෙන් පමණක් පරම විමුක්තිය උදාකරගත හැකි බව මෙම සම්ප්‍රදාය අවධාරණය කරයි. මෙම අධ්‍යයනය මගින් යෝගාචාර අෂ්ට විඥාන පද්ධතියේ ඇති සූක්ෂ්ම ක්‍රියාකාරීත්වය සහ එහි දාර්ශනික පැතිකඩ විමර්ශනය කෙරේ.

**පර්යේෂණ ගැටලුව**

සාම්ප්‍රදායික අභිධර්මයේ එන විඥාන හයේ ආකෘතිය මගින් පැහැදිලි කළ නොහැකි වූ, පුද්ගලයා තුළ නිරන්තරව පවතින 'මම' යන හැඟීම සහ සංසාරික බන්ධනයට හේතු වන සූක්ෂ්ම ආත්ම දෘෂ්ටිය කෙලෙස් මනස තුළ විග්‍රහ වන්නේ කෙසේද? යන්න පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණයේ අරමුණු**

යෝගාචාර අෂ්ට විඥාන සංකල්පය තුළ කෙලෙස් මනස හඳුන්වා දී එහි දාර්ශනික සහ මනෝවිද්‍යාත්මක පැතිකඩ විශ්ලේෂණය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. කෙලෙස් මනස නිරන්තරයෙන් බැඳී පවතින සහජ කෙලෙස් හතර පුද්ගල චර්යාව කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අතිරේක අරමුණයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය  භාවිත කර ඇත. මූලික වශයෙන් වසුබන්ධු හිමියන්ගේ ත්‍රිංශිකා සහ විංශතිකා යන කෘතිවල එන විඥානවාදී ඉගැන්වීම් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කරන ලදී. ද්විතීයික මූලාශ්‍රය ලෙස  විද්වතුන් රචනා කරන ලද ග්‍රන්ථයන් හා ශාස්ත්‍රීය ලිපි පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම සිදු කොට ඇත.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

යෝගාචාර සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කරන ලද අෂ්ට විඥාන සංකල්පය යනු බෞද්ධ මනෝවිද්‍යාවේ සහ දර්ශනයේ සිදු වූ සුවිශේෂී විප්ලවයක් ලෙස අර්ථකථනය කළ හැකිය. සාම්ප්‍රදායික අභිධර්මයේ එන විඥාන හය (පංච ඉන්ද්‍රිය විඥාන සහ මනෝ විඥානය) මගින් මානව විඥානයේ පවතින ගැඹුරු සහ සංකීර්ණ ස්වභාවය විග්‍රහ කිරීමට නොහැකි වීම නිසා යෝගාචාරීන් විසින් විඥානයේ තවත් ස්ථර දෙකක් හඳුන්වා දෙන ලදී. මෙම සාකච්ඡාව තුළ දී හත්වන විඥානය වන කෙලෙස් මනස කේන්ද්‍ර කරගනිමින් එම විඥාන පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ එහි දාර්ශනික අවශ්‍යතාවය විමර්ශනය කෙරේ.

සාම්ප්‍රදායික බුදුදහමේ ඉගැන්වෙන මනෝ විඥානය  යනු ඇතැම් අවස්ථාවලදී ක්‍රියාකාරීත්වය නතර වන විඥාන මට්ටමකි. උදාහරණයක් ලෙස, තද නින්දක දී, සිහිමූර්ජා වූ අවස්ථාවක දී හෝ නිරෝධ සමාපත්තිය වැනි ගැඹුරු භාවනා අවස්ථාවල

දී මනෝ විඥානය ක්‍රියාත්මක නොවේ. එසේ නම්, එවැනි අවස්ථාවක පවා පුද්ගලයා තුළ "මම" යන හැඟීම සහ සංසාරික බන්ධනය ඇති කරන්නේ කෙසේද යන ප්‍රශ්නයට අභිධර්මයේ පිළිතුරු සපයා තිබුණේ නැත. යෝගාචාරීන් විසින් මෙම ගැටලුව විසඳීම සඳහා කෙලෙස් මනස හඳුන්වා දෙන ලදී. මෙම මනස උපතේ සිට විමුක්තිය දක්වාම අවිච්ඡින්නව ක්‍රියාත්මක වෙමින්, පුද්ගලයා තුළ නිරන්තර මමත්වය පවත්වා ගනු ලබයි. කෙලෙස් මනසෙහි ඇති වඩාත්ම බිහිසුණු ස්වභාවය වන්නේ එය සැමවිටම කෙලෙස් සතරකින් බැඳී පැවතීමයි. එකී කෙලෙස් සහජ කෙලෙස් වන අතර ඒවා පහත පරිදි විග්‍රහ කළ හැකිය. ආත්ම දෘෂ්ටිය (Ātmadṛṣṭi): මෙය බුද්ධිමය මට්ටමෙන් ඇති කරගන්නා දෘෂ්ටියක් නොව, විඥානය තුළ සහජයෙන්ම පවතින "ස්ථිර ආත්මයක් ඇත" යන වැරදි විශ්වාසයයි. ආත්ම මෝහය (Ātmamoha): මෙය ආත්මයේ සැබෑ අනාත්ම ස්වභාවය හෝ අනිත්‍ය ස්වභාවය පිළිබඳ පවතින සූක්ෂ්ම නොදැනුවත්කමයි. ආත්ම මානය (Ātmamāna): මම සිටිමි යන හැඟීමෙන් ඇති වන අභිමානය හෙවත් අහංකාරයයි. ආත්ම ස්නේහය (Ātmasneha): තමන් යයි මවාගත් පුද්ගල අනන්‍යතාව කෙරෙහි පවතින දැඩි ඇලීම හෙවත් ආත්ම තෘෂ්ණාවයි.

මෙම කෙලෙස් හතර නිසා සත්වයා තමාගේ අභ්‍යන්තර විඥාන ප්‍රවාහය (විශේෂයෙන් ආලය විඥානය) දෙස බලමින් එය "මගේ ආත්මය'' ලෙස වරදවා ග්‍රහණය කරගනු ලබයි. මෙය පුද්ගලයා සංසාරික දුකෙහි බැඳ තබන ප්‍රධාන මනෝවිද්‍යාත්මක මූලය ලෙස සාකච්ඡා කළ හැකිය. යෝගාචාර දර්ශනයට අනුව ආලය විඥානය යනු සියලු කර්ම බීජ දරා සිටින "ගබඩා විඥානය'' වේ. කෙලෙස් මනසට ස්වාධීන පැවැත්මක් නොමැති අතර එහි ප්‍රධාන කාර්යය වන්නේ ආලය විඥානය තම අරමුණ කරගැනීමයි. ආලය විඥානය ගංගාවක් මෙන් නිරන්තරයෙන් වෙනස් වෙමින් ගලා යන ප්‍රවාහයක් වුවද, කෙලෙස් මනස එම අඛණ්ඩතාව වරදවා වටහා ගනිමින් එය ස්ථිර, ඒකීය ආත්මයක් ලෙස සලකා එයට ඇලී පවතියි. මෙම ක්‍රියාවලිය නිසා සිත සහ අරමුණ අතර සම්බන්ධතාවක් නිර්මාණය වන අතර, බාහිර ලෝකය යනු සිතින් පරිබාහිරව පවතින සැබෑ වස්තූන් ලෙස අපට පෙනෙන්නේ මෙම ව්‍යාජ අර්ථකථනය නිසාය.

වසුබන්ධු හිමියන්ගේ විඥප්තිමාත්‍රතාව පිළිබඳ ඉගැන්වීම මෙම අධ්‍යයනයේ දී අතිශය වැදගත් වේ. උන්වහන්සේ පෙන්වා දෙන්නේ අප දකින ලෝකය යනු බාහිරව පවතින භෞතික වස්තූන් සමූහයක් නොව, විඥානය විවිධ ස්වරූපවලට පරිවර්තනය වීම හෙවත් විඥාන පරිණාමය බවයි. වසුබන්ධු හිමියන්ට අනුව විඥානය පරිණාමය වන මට්ටම් තුනකි.

**ආලය විඥානයඃ** බීජ ගබඩා කරන පළමු පරිණාමය. කෙලෙස් මනස (මනන විඥානය) මමත්වය ඇති කරන දෙවන පරිණාමය

**ප්‍රවෘත්ති විඥානයඃ** බාහිර රූප, ශබ්ද ආදිය ලෙස පෙනී සිටින තෙවන පරිණාමය

මෙහිදී කෙලෙස් මනස විසින් බාහිර පෙනීම්වලට "මමත්වය'' ආරෝපණය නොකරන්නේ නම්, එම පෙනීම් පුද්ගලයාගේ සංසාර බන්ධනයට හේතු නොවේ. වසුබන්ධු හිමියන් සිහිනයක් සහ නිරයගාමී සත්වයන්ගේ අත්දැකීම් උපයෝගී කරගනිමින් පෙන්වා දෙන්නේ, බාහිර වස්තුවක් නොමැතිව වුවද විඥානය තුළ බාහිර

ලෝකයක පෙනීමක් සහ පොදු අත්දැකීම් නිර්මාණය විය හැකි බවයි. කෙලෙස් මනස හඳුන්වා දීමට තවත් හේතුවක් වූයේ මනෝ විඥානයට පදනමක් සැපයීමයි. පංච ඉන්ද්‍රිය විඥානවලට ඇස, කන වැනි භෞතික ඉන්ද්‍රියයන් පදනම ලෙස පවතින නමුත්, මනෝ විඥානයට එවැනි සහජ පදනමක් නොතිබුණි. යෝගාචාරීන් පෙන්වා දුන්නේ කෙලෙස් මනස යනු මනෝ විඥානය හටගැනීම සඳහා පවතින සමගාමී ඉන්ද්‍රිය බවයි. මෙය විඥානය ස්ථර කිහිපයකින් එකවර ක්‍රියාත්මක විය හැකි බව තහවුරු කරන ඉතා දියුණු මනෝවිද්‍යාත්මක විග්‍රහයකි.

යෝගාචාර පංච මාර්ගය තුළ අවසාන ඉලක්කය වන්නේ ආශ්‍රය පරාවෘත්ති හෙවත් විඥානයේ පදනම මුළුමනින්ම පරිවර්තනය කිරීමයි. මෙහිදී ප්‍රධාන කාර්යය වන්නේ කෙලෙස් මනස සතු එම සතර කෙලෙස් මුළුමනින්ම ඉවත් කිරීමයි. කෙලෙස් මනස විසින් ආලය විඥානය වැරදියට ග්‍රහණය කරගැනීම නතර කළ විට, ආලය විඥානය තුළ පවතින සියලු අකුසල බීජ ක්ෂය වී එය "පිරිසිදු විඥානයක" බවට පත් වේ. මෙය අර්හත්ත්වයේදී හෝ බුද්ධත්වයේ දී සිදු වන මනෝවිද්‍යාත්මක පරිවර්තනයයි.

**නිගමනය**

මෙම අධ්‍යයනයෙන් නිගමනය වනුයේ යෝගාචාර අෂ්ට විඥාන පද්ධතිය තුළ කෙලෙස් මනස යනු සංසාර බන්ධනය තහවුරු කරන ප්‍රධානතම දාර්ශනික මූලය බවයි. එය ආලය විඥානය ආත්මයක් ලෙස වරදවා වටහා ගනිමින් පුද්ගලයා තුළ මමත්වය පිළිබඳ මිථ්‍යාව නිරන්තරයෙන් පෝෂණය කරයි. මෙම සූක්ෂ්ම විඥාන මට්ටම අවබෝධ කර ගැනීමෙන් තොරව, විඥප්තිමාත්‍රතාව හෙවත් බාහිර ලෝකය යනු සිතේම පෙනීමක් බව ප්‍රත්‍යක්ෂ කළ නොහැකිය. විමුක්ති මාර්ගයේදී කෙලෙස් මනස සතු සතර කෙලෙස් ප්‍රහීණ කිරීම හරහා විඥානයේ පදනම පරිවර්තනය කිරීම (ආශ්‍රය පරාවෘත්ති) මගින් පමණක් පූර්ණ බුද්ධත්වය උදාකරගත හැකි බව මෙම අධ්‍යයනය මගින් තහවුරු වේ. කෙලෙස් මනස පිළිබඳ මෙම විග්‍රහය නූතන මනෝවිද්‍යාවේ එන "යටි සිත" සහ "අහංකාරය" පිළිබඳ සංකල්පවලට ඉතා ගැඹුරු දාර්ශනික පදනමක් සපයයි.

**ප්‍රමුඛ පද** - අෂ්ට විඥානය, ආත්ම දෘෂ්ටිය, ආලය විඥානය, කෙලෙස් මනස , විඥාන පරිණාමය

**ආශ්‍රිත ග්‍රන්ථ**

Chandima Himi, R.P.K. (2019). *Sāratthapanī nāma Teravāda Mahāyāna Vimaṃsā*. Malabe: Sarasavi Publishers.

Kalupahana, D.J. (2008). *The Principles of Buddhist Psychology*. Delhi: Sri Satguru Publications.

Lusthaus, D. (2002). *Buddhist Phenomenology: A Philosophical Investigation of Yogacara Buddhism and the Ch'eng Wei-shih Lun*. London: RoutledgeCurzon.

Tusinishiri Himi, V. (2024). 'Yogācāra sampradāyagata pañca mārga saṅkalpayehi niṣṭhā mārgaya piḷibanda vimarśanātmaka adhyayanayak'. In: *Proceedings of the 08th International Buddhist Conference*. Anuradhapura: Bhiksu University of Sri Lanka.

Wijithasara Thero, M. (2017). 'The Concept of Mind in Buddhist Tradition and Viññāṇavāda'. *Pragnāsāra Scholarly Journal*, 4.

Yasassi Himi, M. (2018). 'Ālaya Vijñānaya - Ālaya Viññāṇaya (Saṃkṣipta Adhyayanayak)'. *Academic Journal of Buddhist Studies*, 1, pp. 117-124.